# ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය

# *වාර්ෂික කර්මාන්ත සංඛ්‍යාති විවරණිකාව*

1 වන වෙළුම, 2010 ISSN NO 2012-7936


## හැඳින්වීම



ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව කර්මාන්ත සංඛ්‍යාති ගණනය කරනුයේ වසර 10කට වරක් පැවැත්වෙන කර්මාන්ත සංගණනයෙන් හා වාර්ෂිකව සිදුකරන කර්මාන්ත සමීක්ෂණ වලින් රැස් කරනු ලැබූ දත්ත මගිනි. එයින් වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය 1979 වර්ෂයේ නිෂ්පාදන කර්මාන්ත සඳහා ආරම්භ කර ඇති අතර, 1983 වර්ෂයේදී එහි විෂය පථය තව දුරටත් පුළුල් කර පහත කර්මාන්ත ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි වාර්ෂිකව දත්ත එක් රැස් කරනු ලැබේ.

ඒවා නම්,

1. පතල් හා කැණීම්
2. නිෂ්පාදන කර්මාන්ත
3. විදුලිය , ජලය, ගෑස් නිෂ්පාදනය හා බෙදාහැරීම වේ.

වසර 10 කට වරක් පැවැත්වෙන කර්මාන්ත සංගණනයෙන් ලැබෙන කර්මාන්ත ආයතන ලැයිස්තුව උපයෝගී කරගෙන වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය සඳහා නියැදි රාමුව සකස් කර ගැනේ.මෙහිදී පුද්ගලයින් 20 හෝ ඊට වැඩි කර්මාන්ත ආයතන වල නියැදි රාමුව යාවත්කාලීන කිරීම, එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානයේ (U N I D O ) සහයෝගීතාවයෙන් 2002 හා 2007 වර්ෂවල පැවැත්වූ වැඩසටහන මගින් සිදුවූ අතර තවදුරටත් වාර්ෂිකව සිදුකරනු ලබන කර්මාන්ත සමීක්ෂයෙන් ලබාගන්නා තොරතුරු මගින්ද, යාවත්කාලීන කරනු ලබයි.

1984 සිට මේ දක්වා වාර්ෂිකව පවත්වන මෙම කර්මාන්ත සමීක්ෂණයෙන් පහත දැක්වෙන කර්මාන්ත සංඛ්‍යාති ලබා ගැනේ.

- නියුතු පුද්ගලයින් සංඛ්‍යාව
- නිමැවුම් වටිනාකම
- යෙදවුම් වටිනාකම
- ඉන්ධන, විදුලිය හා ජලය පරිභෝජනය
- ස්ථාවර වත්කම් සඳහා දළ එකතු කිරීම.



2009 වර්ෂයේ පැවැත්වූ මෙම සමීක්ෂණය මගින් 2008 වර්ෂයට අදාලව තොරතුරු එක්රැස් කර ඇත.



### *කර්මාන්ත සමීක්ෂණයේ අරමුණු*

- කර්මාන්ත ක්ෂේත්‍රයේ ව්‍යුහය අධ්‍යයනය කිරීම හා නිමානකයන් ලබා ගැනීම
- කර්මාන්ත නාමාවලිය යාවත් - කාලීන කිරීම

### *ඇතුළත පිටු*


| | |
|---|---|
| අංශ අනුව කර්මාන්ත ක්ෂේත්‍රයේ ව්‍යාප්තිය | 2 |
| අංශ අනුව කර්මාන්තවල නිමවුම, යෙදවුම හා වැටුප් | 2 |
| කර්මාන්ත ක්ෂේත්‍රයේ මූලික නිමානකයන් | 3 |
| කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායිතාවය | 3 |
| පළාත් අනුව කර්මාන්ත ව්‍යාප්තිය | 4 |
| දිස්ත්‍රික්ක අනුව කර්මාන්ත ව්‍යාප්තිය | 4 |

## අංශ අනුව කර්මාන්ත ආයතනවල ව්‍යාප්තිය
**(පුද්ගලයින් 5 හෝ ඊට වැඩියෙන් නියුතු කර්මාන්තායතන සඳහා)**

ශ්‍රී ලංකාවේ පුද්ගලයින් 5 හෝ ඊට වැඩියෙන් නියුතු කර්මාන්ත ආයතන සංඛ්‍යාවෙන් 90.0% ක පමණ ප්‍රතිශතයක් එනම් ආයතන17,368 ක් නිෂ්පාදන කර්මාන්ත අංශය මගින් ආවරණය කරනු ලබයි. විදුලිය, ජලය, ගෑස් නිෂ්පාදනය හා බෙදා හැරීමේ කර්මාන්ත අංශය 0.3% ක ප්‍රතිශතයක් ගනී. පතල් හා කැණීම් අංශයේ ආයතන 1,878 ක් වන අතර එය 9.7% ක ප්‍රතිශතයක් වේ.

රූපය 1. ප්‍රධාන කර්මාන්ත අංශ අනුව ආයතනවල ව්‍යාප්තිය –2008
(පුද්ගලයින් 5 හෝ ඊට වැඩියෙන් නියුතු කර්මාන්තායතන සඳහා)




මූලාශ්‍රය - වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය - 2009

වගු අංක 1. ප්‍රධාන කර්මාන්ත අංශ අනුව කර්මාන්ත ආයතනවල ව්‍යාප්තිය – 2008
(පුද්ගලයින් 5 හෝ ඊට වැඩියෙන් නියුතු කර්මාන්තායතන සඳහා)

| ප්‍රධාන කර්මාන්ත අංශය | ආයතන සංඛ්‍යාව | % |
|---|---|---|
| පතල් හා කැණීම් | 1,878 | 9.7 |
| නිෂ්පාදන කර්මාන්ත | 17,368 | 90.0 |
| විදුලිය, ජලය, ගෑස් නිෂ්පාදනය හා බෙදා හැරීම | 46 | 0.3 |
| එකතුව | 19,292 | 100.0 |

මූලාශ්‍රය - වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය - 2009

## අංශ අනුව කර්මාන්තවල නිමැවුම, යෙදවුම හා වැටුප් - 2008
**(පුද්ගලයින් 5 හෝ ඊට වැඩියෙන් නියුතු කර්මාන්තායතන සඳහා)**

ප්‍රධාන කර්මාන්ත අංශය අනුව නිමැවුම, යෙදවුම සහ වැටුප් හා වේතනවල වටිනාකම සලකා බලන විට උපරිම අගයක් පෙන්නුම් කරනුයේ නිෂ්පාදන කර්මාන්ත අංශයේ වේ. එම අංශය නිමවුම්, යෙදවුම්, වැටුප් හා වේතනයන් සඳහා පිළිවෙළින් 94.0%, 95.7% හා 87.2%ක දායකත්වයක් මුළු කර්මාන්ත ක්ෂේත්‍රයට දක්වයි.



වගු අංක 2 - අංශ අනුව කර්මාන්තවල නිමැවුම, යෙදවුම හා වැටුප් - 2008
(පුද්ගලයින් 5 හෝ ඊට වැඩියෙන් නියුතු කර්මාන්තායතන සඳහා)

| කර්මාන්ත අංශය | නිමැවුම (රු. මිලි.) | % | යෙදවුම (රු.මිලි.) | % | වැටුප් හා වේතන (රු.මිලි.) | % |
|---|---|---|---|---|---|---|
| පතල් හා කැණීම් | 12,319 | 0.8 | 4,321 | 0.4 | 2,722 | 2.1 |
| නිෂ්පාදන කර්මාන්ත | 1,521,985 | 94.0 | 949,587 | 95.7 | 111,363 | 87.2 |
| විදුලිය, ජලය, ගෑස් නිෂ්පාදනය හා බෙදාහැරීම | 84,039 | 5.2 | 38,110 | 3.9 | 13,620 | 10.7 |
| එකතුව | 1,618,343 | 100.0 | 992,018 | 100.0 | 127,705 | 100.0 |



මූලාශ්‍රය - වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය - 2009

# කර්මාන්ත ක්ෂේත්‍රයේ මූලික නිමානක

වගු අංක 3 - කර්මාන්ත ක්ෂේත්‍රයේ මූලික නිමානක (පුද්ගලයින් 10 හෝ ඊට වැඩියෙන් නියුතු කර්මාන්තායතන සඳහා)

| නිමානකය | කර්මාන්ත සංගණනය 2003 /2004 අනුව (2003 වර්ෂයේදී ) | වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය 2009 අනුව (2008 වර්ෂයේදී ) | සාමාන්‍ය වාර්ෂික වැඩිවීමේ ප්‍රතිශතය |
|---|---|---|---|
| නියුතු පුද්ගලයන් ගණන | 728,743 | 779,062 | 1.4 |
| වැටුප් හා වේතන (රු.මිලි.) | 68,370 | 120,832 | 15.3 |
| නිමවුම් වටිනාකම (රු.මිලි.) | 891,344 | 1,583,241 | 15.5 |
| යෙදවුම් වටිනාකම (රු.මිලි.) | 458,249 | 975,447 | 22.6 |
| එකතු වූ අගය (රු.මිලි.) | 433,094 | 607,794 | 8.0 |
| ස්ථාවර වත්කම් සඳහා දළ එකතු කිරීම් (රු.මිලි.) | 53,860 | 97,361 | 16.2 |

ඉහත වගුව අනුව පුද්ගලයින් 10 හෝ ඊට වැඩියෙන් නියුතු කර්මාන්තායතන සලකන විට 2003 වර්ෂයට සාපේක්ෂව 2009 වර්ෂයේදී කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ මූලික නිමානකවල සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරයි. ඒ අනුව කර්මාන්ත ක්ෂේත්‍රයේ නියුතු පුද්ගලයින් ගණන 2003 කර්මාන්ත සංගණනයට සාපේක්ෂව 2009 වාර්ෂික කර්මාන්ත සමීක්ෂණයේදී 50,319 කින් පමණ වැඩි වී ඇති අතර එය වාර්ෂිකව 1.4% ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2003 වර්ෂයේ සිට 2008 දක්වා වූ කාලය තුළ එකතු වූ අගය 8.0 % ක සාමාන්‍ය වාර්ෂික වර්ධනයක් ලබා ගෙන ඇත.

එමෙන්ම 2009 වර්ෂයේ කර්මාන්ත සමීක්ෂණයට අනුව යෙදවුම්වල වටිනාකම 22.6%ක වැඩිවීමක් පෙන්නුම් කරයි.

එසේම වැටුප් හා වේතන රු.මිලියන 52,462කින්ද, නිමවුම් වටිනාකම රු.මිලියන 691,897කින් ද, යෙදවුම්වල වටිනාකම රු.මිලියන 517,198කින් ද වර්ධනය වී තිබේ. එකතු වූ අගය රු. මිලියන 174,700 කින් වැඩි වී ඇති අතර ස්ථාවර වත්කම් සඳහා දළ එකතු කිරීම් රු.මිලියන 43,501 කින් වැඩි වී ඇත.

# කර්මාන්ත ක්ෂේත්‍රයේ ඵලදායිතාවය

2003 වර්ෂය හා සසඳන විට 2008 වර්ෂය තුළ සමස්ත කර්මාන්ත අංශයේ දළ ශ්‍රම ඵලදායිතාවය හා ශුද්ධ ශ්‍රම ඵලදායිතාවයේ කැපී පෙනෙන වර්ධනයක් දැකිය හැකිය.

වගු අංක 4 - අංශ අනුව කර්මාන්තවල ඵලදායිතාවය -2003/2008 (පුද්ගලයින් 5 හෝ ඊට වැඩියෙන් නියුතු කර්මාන්තායතන සඳහා)

| ප්‍රධාන කර්මාන්ත අංශය | *දළ ශ්‍රම ඵලදායිතාවය (රු.මිලි.) | | **ශුද්ධ ශ්‍රම ඵලදායිතාවය (රු.මිලි.) | |
|---|---|---|---|---|
| | 2003 | 2008 | 2003 | 2008 |
| පතල් හා කැණීම් | 0.30 | 0.60 | 0.27 | 0.40 |
| නිෂ්පාදන කර්මාන්ත | 1.10 | 1.90 | 0.51 | 0.70 |
| විදුලිය, ජලය,ගෑස් නිෂ්පාදනය හා බෙදාහැරීම | 2.44 | 3.40 | 1.64 | 1.90 |



$$\text{* දළ ශ්‍රම ඵලදායිතාවය} = \frac{\text{නිමැවුම}}{\text{නියුතු පුද්ගලයන් සංඛ්‍යාව}} \qquad \text{** ශුද්ධ ශ්‍රම ඵලදායිතාවය} = \frac{\text{එකතු කළ අගය}}{\text{නියුතු පුද්ගලයන් සංඛ්‍යාව}}$$

පතල් හා කැණීම් අංශයේ දළ ශ්‍රම ඵලදායිතාවය 2003 වර්ෂයට සාපේක්ෂව දෙගුණ වී ඇති අතර නිෂ්පාදන කර්මාන්ත අංශය රුපියල් මිලියන 0.80 ක වර්ධනයක් ලබා ගෙන ඇත. විදුලිය, ජලය, ගෑස් නිෂ්පාදනය හා බෙදාහැරීමේ අංශය ලබා ගෙන ඇති වර්ධනය රුපියල් මිලියන 0.96 කි. ශුද්ධ ශ්‍රම ඵලදායිතාවය සලකා බැලීමේදී එක් පුද්ගලයෙක් එකතු කළ අගයට දක්වන දායකත්වය 2003 වර්ෂයට සාපේක්ෂව 2008 වර්ෂයේදී පතල් හා කැණීම් අංශය සඳහා රුපියල් මිලියන 0.13 ක් ද නිෂ්පාදන කර්මාන්ත අංශය සඳහා රුපියල් මිලියන 0.19 ක් ද විදුලිය, ජලය, ගෑස් නිෂ්පාදනය හා බෙදාහැරීමේ අංශය රුපියල් මිලියන 0.26 ක් ද ලෙස වර්ධනයක් ලබා ගෙන ඇත.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
මේට්ලන්ඩ් චන්ද්‍ර වංකය,
කොළඹ 07

දු.ක 011 - 2682176
ෆැක්ස් : 011 - 2697594
විද්‍යුත් තැපැල:
dgcensus@statstics.gov.lk.

වෙබ් අඩවිය
www.statistics.gov.lk

ප්‍රකාශනය:
කර්මාන්ත ,ඉදිකිරීම් , වෙළඳ හා සේවා අංශය ,
අංක 104 ඒ,කිතුල්වත්ත පාර, කොළඹ 08

දු.ක 011-2676195
ෆැක්ස් : 011-2676194
විද්‍යුත් තැපැල:
industries@statistics.gov.lk

# පළාත් අනුව කර්මාන්ත ව්‍යාප්තිය

**රූපය 2. පළාත් අනුව කර්මාන්තවල ව්‍යාප්තිය –2008 (පුද්ගලයින් 5 හෝ ඊට වැඩියෙන් නියුතු කර්මාන්තායතන සඳහා)**






මූලාශ්‍රය - වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය - 2009

පළාත් අනුව ශ්‍රී ලංකාවේ කර්මාන්ත ව්‍යාප්තිය සලකා බලන විට වැඩිම කර්මාන්ත සංඛ්‍යාවක් ස්ථාන ගත වී ඇත්තේ බස්නාහිර පළාත තුළය. එය මුළු කර්මාන්ත සංඛ්‍යාවෙන් 42%කි. 2009 වාර්ෂික කර්මාන්ත සමීක්ෂණයට අනුව , 2% ක අඩුම කර්මාන්ත ප්‍රතිශතයක් ස්ථාන ගත වී ඇත්තේ උතුරු පළාත තුළය. සමස්ත කර්මාන්ත ව්‍යාප්තිය සලකන විට වයඹ හා මධ්‍යම පළාත් තුළද සැලකිය යුතු කර්මාන්ත සංඛ්‍යාවක් ස්ථාන ගතවී ඇති බව පැහැදිලි වේ.

# දිස්ත්‍රික්ක අනුව කර්මාන්ත ව්‍යාප්තිය

වගු අංක 5 අනුව 19.41% ක ප්‍රතිශතයකින් යුත් වැඩිම කර්මාන්ත ආයතන සංඛ්‍යාවක් ස්ථානගතව ඇත්තේ කොළඹ දිස්ත්‍රික්කයේ වන අතර ඊට පසු පිළිවෙලින් වැඩි ප්‍රතිශතයන් පෙන්නුම් කෙරෙනුයේ ගම්පහ හා කුරුණෑගල දිස්ත්‍රික්ක වලය. එම ප්‍රතිශතයන් පිළිවෙලින් 17.21%, 11.97% ක් වේ.

එසේම දිස්ත්‍රික්ක අනුව සේවා නියුක්තිය සළකා බැලීමේදී ද ඊට වැඩි දායකත්වයක් දක්වන්නේ ඉහත දිස්ත්‍රික්ක තුනෙනි. වවුනියාව, මන්නාරම හා මුලතිවු, ත්‍රිකුණාමලය, මඩකලපුව සහ මොණරාගල යන දිස්ත්‍රික්ක අනිකුත් දිස්ත්‍රික්ක හා සැසඳීමේදී ආයතන සංඛ්‍යාවේ හා සේවා නියුක්තියේ අඩු ප්‍රතිශතයන් පෙන්නුම් කරයි.

**වගු අංක 5 - කර්මාන්ත හා සේවා නියුක්තියේ ව්‍යාප්තිය දිස්ත්‍රික්ක අනුව –2008 (පුද්ගලයින් 5 හෝ ඊට වැඩියෙන් නියුතු කර්මාන්තායතන සඳහා)**

| දිස්ත්‍රික්කය | ආයතන සංඛ්‍යාව % | සේවයේ නියුතු පුද්ගලයින් සංඛ්‍යාව % |
|---|---|---|
| කොළඹ | 19.41 | 25.58 |
| ගම්පහ | 17.21 | 26.12 |
| කළුතර | 5.33 | 6.96 |
| මහනුවර | 8.52 | 5.81 |
| මාතලේ | 1.65 | 1.16 |
| නුවරඑළිය | 1.82 | 2.29 |
| ගාල්ල | 4.91 | 4.51 |
| මාතර | 2.42 | 1.87 |
| හම්බන්තොට | 1.04 | 1.53 |
| යාපනය | 1.65 | 0.45 |
| වවුනියාව | 0.21 | 0.05 |
| මන්නාරම සහ මුලතිවු | 0.09 | 0.03 |
| මඩකලපුව | 0.76 | 0.20 |
| අම්පාර | 2.31 | 0.98 |
| ත්‍රිකුණාමලය | 0.38 | 0.13 |
| කුරුණෑගල | 11.97 | 9.12 |
| පුත්තලම | 7.99 | 3.20 |
| අනුරාධපුරය | 1.95 | 1.34 |
| පොළොන්නරුව | 1.85 | 1.39 |
| බදුල්ල | 1.76 | 1.25 |
| මොණරාගල | 0.82 | 0.43 |
| රත්නපුර | 4.17 | 3.74 |
| කෑගල්ල | 1.78 | 1.86 |

මූලාශ්‍රය - වාර්ෂික කර්මාන්ත සමීක්ෂණය - 2009